# පොලිස් මාධ්‍ය කොට්ඨාසය
## பொலிஸ் ஊடகப் பிரிவு
## POLICE MEDIA DIVISION
සෙත්සිරිපාය, බත්තරමුල්ල

තැ.පෙ.අංකය / த. பெ.இ / Po.Box No — 10120

ෆැක්ස් / தொலைநகல / Fax — 011-2171635

දුරකථන / தொலைபேசி / Telephone — 011-2887973 (HUNTING)

වෙබ්.ලිපිනය / இணையதளம் / Web Site — www.Police.lk

ඊ මේල් / மின்னஞ்சல் / E-mail — dir.media@police.gov.lk


මගේ අංකය / எனது இலக்கம் / My NO — 544/ 2024

ඔබේ අංකය / உமது இலக்கம் / Your No — / 2024

දිනය / திக / Date — 28/03/2024 පැය 2340

# මාධ්‍ය නිවේදනය

## මහ සිකුරාදා සහ පාස්කු ඉරිදා දේව මෙහෙයන් පැවැත්වෙන දේවස්ථාන සඳහා විශේෂ පොලිස් ආරක්ෂාවක් - පොලිස් මූලස්ථානය.

2024.03.29 වන මහ සිකුරාදා හා 2024.03.31 වන දින පාස්කු ඉරිදා දේව මෙහෙයන් පවත්වනු ලබන සියළුම කිතුණු දේවස්ථාන සඳහා විශාල බැතිමතුන් පිරිසක් සහභාගී වනු ඇතැයි අපේක්ෂා කරන අතර, මේ හේතුවෙන් විශේෂ පොලිස් ආරක්ෂාවක් යෙදවීමට පොලිස්පති දේශබන්දු තෙන්නකෝන් මහතා විසින් පොලිස් ස්ථානාධිපතිවරුන් වෙත උපදෙස් ලබාදී ඇත.

ශ්‍රී ලංකාව පුරා පොලිස් වසම්වල පිහිටා තිබෙන කිතුණු දේවස්ථාන 2978 කින් දේවස්ථාන 2239 ක දේව මෙහෙයන් පවත්වනු ලබයි. 2024.03.29 වන දින සිට 2024.03.31 වන දින දක්වා දේව මෙහෙයන් පවත්වනු ලබන දේවස්ථාන ඇතුළු දේවස්ථාන 2253 ක පියතුමන්ලා සමඟ එම ප්‍රදේශවල ස්ථානාධිපතිවරුන් සාකච්ඡා කර විශේෂ ආරක්ෂක වැඩ පිළිවෙලක් සකස් කර ක්‍රියාත්මක කිරීමට සැලසුම් කර ඇත. මේ සඳහා පොලිස් නිලධාරීන්, පොලිස් විශේෂ කාර්ය බලකා නිලධාරීන් සහ බුද්ධි නිලධාරීන් යොදා ගනු ලබන අතර, ත්‍රිවිධ හමුදා නිලධාරීන්ගේද සහාය ලබා ගැනීමට නියමිතයි.

**මාධ්‍ය ප්‍රකාශක කාර්යාලය**
**පොලිස් මාධ්‍ය කොට්ඨාසය.**